වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
வியாபார மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
**Department of Trade and Investment Policy**

මහලේකම් කාර්යාලය,කොළඹ - 01
செயலகம்,கொழும்பு - 01
The Secretariat, Colombo - 01

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதார மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
Ministry of Finance, Economic and Policy Development

RECEIVED 6 APR 2020 S.L.Customs PP&R. Division

මගේ අංකය / எனது இல. / My No. TIP/TP/01/10(123)
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2020.04.16

රජයේ මුද්‍රණාලයාධිපති
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

මහත්මියණි

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය**

ගරු මුදල් , ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා විසින් පනවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය **2020.04.16** දිනැති අංක **2171/2** දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සකස් කර මේ සමග එවමි.

මෙම නිවේදනයේ සෝදුපත් කියවීම සඳහා කොළඹ 01, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතනු මැනවි (කාර්යාලයීය දුරකථන අංකය 2484930 වේ).

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව ඉන් පිටපත් 525 ක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද, පිටපත් 25 ක් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙතද එවනු මැනවි.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ විධි විධාන අනුව අප්‍රමාදව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුව ඇති බැවින් මුද්‍රිත පිටපත් ඉතා ඉක්මනින් මා වෙත ලැබෙන්නට සලස්වන්නේ නම් කෘතඥ වෙමි.

මෙයට - විශ්වාසී

**කේ. ඒ. විමලේන්තිරරාජා**
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්** - 1. රේගු අධ්‍යක්ෂ ජනරාල්, මේ සමග එවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ වන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය කටයුතු සඳහා

2. අධ්‍යක්ෂ ජනරාල්, වානිජ දෙපාර්තමේන්තුව - *වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) දැනුවත් කිරීම සඳහා*

3. අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව- වෙබ් පිටුවේ පළකිරීම සඳහා

D DC (ICT)
Fwd

දුරකථන අංකය / தொலைபேசி / Telephone 0112 484 888
ෆැක්ස් / தொலைநகல் / Fax 0112 484 830
විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / e-mail admin@tipd.treasury.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.treasury.gov.lk

U. A. Hettiarachchi
Deputy Director of Customs
Sri Lanka Customs

## රජයේ නිවේදනයයි

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

## 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 අප්‍රේල් මස ...17......දින සිට ආරම්භ වන මාස 02 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2019.05.21 දිනැති අංක 2124/2 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් වියළි මිදි (සංයෝජිත වර්ගීකරණ අංක 0806.20), 2019.09.30 දිනැති අංක 2143/3 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් අළුත් මිදි (සංයෝජිත වර්ගීකරණ අංක 0806.10), 2019.11.07 දිනැති අංක 2148/25 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් වියළි දොඩම්,පෙයාර්ස්, අනෙකුත් වෙරීස් සහ ප්ලම්ස් සහ ස්ලෝස් (සංයෝජිත වර්ගීකරණ අංක 0805.10.20, 0808.30,0809.29 සහ 0809.40), සහ 2020.02.01 දිනැති අංක 2160/63 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් අළුත් දොඩම් සහ අළුත් ඇපල් (*සංයෝජිත වර්ගීකරණ අංක 080510.10 සහ 0808.10*) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2020 අප්‍රේල් මස ...17...... වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**මහින්ද රාජපක්ෂ**
**මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය**

2020 අප්‍රේල් මස 16.... වන දින
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේදීය.

# Government Notification

## Special Commodity Levy Act, No. 48 of 2007

## Order under Section 2

By virtue of the powers vested in me under Section 2 of the Special Commodity Levy Act No. 48 of 2007, I, Mahinda Rajapaksa, Minister of Finance, Economic and Policy Development of the Democratic Socialist Republic of Sri Lanka, do by this order impose in respect of the commodity specified in Column I of the Schedule hereto a Special Commodity Levy at the rate specified in the corresponding entries in Column II of that Schedule.

This Order shall be valid for a period of 02 months commencing from April ..17....., 2020 subject to provisions of Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007.

The Order made under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007 and published in the Extraordinary Gazette Notification No. 2124/2 of 21.05.2019 in respect of Dried Grapes (HS Code 0806.20), the Extraordinary Gazette Notification No. 2143/3 of 30.09.2019 in respect of Fresh Grapes (HS Code 0806.10), the Extraordinary Gazette Notification No. 2148/25 of 07.11.2019 in respect of Dried Oranges, Pears, Other Cherries and Plums and soles (HS Codes 0805.10.20,0808.30,0809.29, and 0809.40), and the Extraordinary Gazette Notification No. 2160/63 of 01.02.2020 in respect of Fresh Oranges and Fresh Apples (HS Codes 0805.10.10 and 0808.10) are rescinded with effect from April ....17......., 2020.

**Mahinda Rajapaksa**
**Minister of Finance, Economic and Policy Development**

Ministry of Finance, Economic and Policy Development
Colombo 01,
April....16..... 2020